# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1994 අංක 21 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 ඔක්තෝබර් මස 31 දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1994 නොවැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : රු. 2.70 යි. තැපැල් ගාස්තුව : රු. 3.10 යි.

## 1994 අංක 21 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 ඔක්තෝබර් මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 60/93

### 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1994 අංක 21 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 1979 අංක 28 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම ඡේදයේ (Lxiii) වන අනුඡේදයේ "ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය; සහ" යන වචන වෙනුවට "ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම ඡේදයේ (Lxiv) වන අනුඡේදයේ "ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය' යන වචන වෙනුවට "ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම ඡේදයේ (Lxiv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන්:—

"(Lxv) 1971 අංක 38 දරන මුදල් පනතේ IV වන කොටස යටතේ පිහිටුවන ලද තේ, රබර් සහ පොල් සඳහා වූ ස්ථායීකරණ අරමුදලේ ලාභ සහ ආදායම්;

(Lxvi) (96 වන අධිකාරය වන) භාර ආඥාපනත යටතේ සංස්ථාගත කරන ලද ජනසවිය භාරකාර අරමුදලේ ලාභ සහ ආදායම්;

(Lxvii) 1970 අංක 26 දරන ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ලාභ සහ ආදායම්;

(Lxviii) ඇමෙරිකා එක්සත් ජනපදයේ විදේශීය පුද්ගලික ආයෝජන සංස්ථාවේ ලාභ සහ ආදායම්;

(Lxix) ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදලේ ලාභ සහ ආදායම්;

(Lxx) ලෝක සංරක්ෂණ සංගමයේ ලාභ සහ ආදායම.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) එම උපවගන්තියේ (ඊ) ඡේදයේ—

2—ඩී 032767—5,900 (94/10)

(i) එම ඡේදයේ (iii) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(iii) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් විශේෂිත නියෝජ්‍යායතනයක් මගින් හෝ ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුවේ සිවිල් විෂය ආධාර වැඩ සටහන මගින් හෝ (කාර්මික ආධාර අංශය ඇතුළුව) කොළඹ ක්‍රම සංවිධානය මගින් හෝ ආසියා පදනම මගින් හෝ සමාකාර ස්වභාවයක් ඇති බවට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ වෙනත් යම් සංවිධානයක් මගින් හෝ ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබුවා වූ ද—

(අ) තම වේතනය හෝ ප්‍රධාන පඩිනඩි අවස්ථෝචිත පරිදි එවැනි යම් සංවිධානයක්, වැඩ සටහනක් හෝ පදනමක් හෝ වෙනත් යම් සංවිධානයක් මගින්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට ප්‍රදාන හෝ වෙනත් ආධාර වශයෙන් සපයන ලද අරමුදල්වලින් ගෙවිය යුතු වූ ද;

(ආ) තම වේතනය හෝ ප්‍රධාන පඩිනඩි ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙවනු නොලබන්නා වූ ද යම් විශේෂඥයකුගේ, උපදේශකයකුගේ කාර්මික ශිල්පියකුගේ හෝ නිලධරයකුගේ;";

(ii) එම ඡේදයේ (viii) වන අනුඡේදයේ "ආසියා පදනම විසින්" යන වචන වෙනුවට "ආසියා පදනම විසින් හෝ ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදල විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම උපවගන්තියේ (ඌ) ඡේදයේ "ලෝක බැංකුව හෝ රතුකුරුස සංගමයේ අන්තර් ජාතික කමිටුව" යන වචන වෙනුවට "ලෝක බැංකුව, රතුකුරුස සංගමයේ අන්තර් ජාතික කමිටුව හෝ ලෝක සංරක්ෂණ සංගමය' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාව සමග ගිවිසුමකට එළඹී ව්‍යවසායක් නොවන" යන වචන හා ඉලක්කම් වෙනුවට "ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින්, තත්කාර්යය සඳහා 1993 නොවැම්බර් මස 11 වන දිනට පෙර කරන ලද ඉල්ලීමක් මත, 1994 දෙසැම්බර් මස 31 වන දිනට පෙර ගිවිසුමකට එළඹී ව්‍යවසායක් නොවන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (iv) වන අනුඡේදයේ අතුරු විධානයේ (1) වන ඡේදයේ සහ (2) උපවගන්තියේ විධිවිධාන කුමක් වුව ද, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට එළඹ ඒ ගිවිසුම යටතේ ප්‍රදානය කෙරෙන ආදායම් බද්දෙන් නිදහස්වීම වෙනුවට ආදායම් බද්දට යටත්වීමට මනාපය පළ කර තිබෙන ව්‍යවසායක් විසින් ශ්‍රී ලංකාවට ගෙන්වා සේවයේ යොදවා ගනු ලැබ සිටින තැනැත්තකුගේ පඩිනඩි, ඒ තැනැත්තා ඒ ව්‍යවසායේ සේවා නියුක්තිය අවසාන කරන දිනය සහ, එම මනාපය තිබූ නොවේ නම් එම ව්‍යවසාය සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද ආදායම් බද්දෙන් නිදහස්වීම අවසාන විය හැකිව තිබූ දිනය යන දින දෙකින් වඩා කලින් එළඹෙන දිනය දක්වා, ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (අ) ඡේදයේ—

(අ) "ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමක් ඇති කරගනු ලැබූ" යන වචන හා ඉලක්කම් වෙනුවට "ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ, තත් කාර්යය සඳහා 1993 නොවැම්බර් මස 11 වන දිනට පෙර කරන ලද ඉල්ලීමක් මත, 1994 දෙසැම්බර් මස 31 වන දිනට පෙර ඇති කර ගත් ගිවිසුමක් වන, ගිවිසුමක් ඇති කර ගනු ලැබූ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම ඡේදයේ (ii) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) මේ පනතේ 32 ෂ වගන්තියේ (1) වන උපවගන්තියෙහි පටහැනිව කුමක් සඳහන් ව ඇත ද ශ්‍රී ලංකාවේ නේවාසික නොවන යම් තැනැත්තකුට ගෙවනු ලබන යම් ලාභාංශයක් ;";

(2) එම වගන්තියේ (ඇඇ) ඡේදයේ " අවුරුදු දෙකක් ඇතුළත " යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය දක්වා වූ සියලු වචන සහ ඉලක්කම් වෙනුවට " අවුරුදු දෙකක් ඇතුළත අතරමැදි සමාගම් එකක් හෝ වැඩි ගණනක් මගින් යම් සමාගමකට ලැබුණු (අ) හෝ (ආ) ඡේදයෙහි සඳහන් වන යම් ලාභාංශයකින් ඒ සමාගමේ කොටස් හිමියකුට 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ගෙවන ලද ලාභාංශය අන්තිමට සඳහන් ලාභාංශය, ගෙවනු ලැබුවේ පළමුව සඳහන් ලාභාංශය ලැබුණ වර්ෂය ඇතුළත හෝ ඊට පසුව එක් වර්ෂයක් ඇතුළත නම්; තව ද " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම ඡේදයේ (XXII) වන අනුඡේදයේ " ද්විතියික වෙළෙඳ පොළේ විකිණීමෙන්. " යන වචන වෙනුවට " ද්විතියික වෙළෙඳ පොළේ විකිණීමෙන් ; " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම ඡේදයේ අවසානයට පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

" (XXIII) නිල ලැයිස්තුගත පොදු සමාගමක අයිතිවාසිකම් නිකුතුවක් යටතේ ලැබුණු යම් කොටසක අයිතිවාසිකමක් අත්හැරීමෙන් හෝ පැවරීමෙන් ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (ඇඇ) ඡේදයේ " ඒ තක්සේරු වර්ෂය තුළ " යන වචන වෙනුවට, " 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (ඇඇඇ) ඡේදයේ " යම් තක්සේරු වර්ෂයක දී " යන වචන වෙනුවට, " 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (ඒ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඒ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් (තත් කාර්යය සඳහා 1993 නොවැම්බර් මස 11 වන දිනට පෙර කරන ලද ඉල්ලීමක් මත, 1994 දෙසැම්බර් මස 31 වන දිනට පෙර ඇති කර ගත්

ගිවිසුමක් වන) ගිවිසුමක් ඇති කර ගනු ලැබූ සමාගමකින්, ඒ ගිවිසුමේ නියමයන් යටතේ ඒ සමාගමේ ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව සම්බන්ධයෙන් ඒ සමාගමින් නිර්වාසික තැනැත්තකු ලද යම් රාජ්‍ය භාගයක් :

එසේ වුවද, ඒ ගිවිසුමේ නියමයන් යටතේ ආදායම් බද්දෙන් නිදහස් වීම වෙනුවට ආදායම් බද්ද අය කරනු ලැබීමට යටත්වීමට ඒ සමාගම මනාපය පළ කරන අවස්ථාවක, මේ ඡේදයෙන් ප්‍රදානය කරනු ලබන ආදායම් බද්දෙන් නිදහස් වීම, එකී මනාපය නිසා නොවේ නම් ඒ සමාගමේ ලාභ හා ආදායම එසේ ආදායම් බද්දෙන් නිදහස් විය හැකි වූ කාලසීමාව වෙනුවෙන් ඒ සමාගමෙන් යම් නිර්වාසික තැනැත්තකුට ලැබුනු යම් රාජ්‍ය භාගයකට අදාළ විය යුතු ය ; " ;

තවද

(4) එම වගන්තියේ (ප) ඡේදයේ "යම් කොටසක් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර විකිණීමෙන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "යම් කොටසක් විකිණීමෙන්" යන වචන ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය සංශෝධනය කිරීම.**

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය "උක්ගස් වගා කිරීම සඳහා වූ ව්‍යවසායක් ; යන වචන වෙනුවට "තේ, රබර්, පොල් හෝ වී හැර වෙනත් කවර හෝ වර්ග යක පැල යොදා ඉඩම් වගා කිරීම සඳහා වූ ව්‍යවසායක් ;" යන වචන අදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඊ වගන්තිය සංශෝධනය කිරීම.**

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඊ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "ඒ තක්සේරු වර්ෂය සඳහා (ප්‍රාග්ධන වත්කම් කිසිවක් විකිණීමෙන් ලැබූ ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ" යන වචන හා ඉලක්කම වෙනුවට, "ඒ තක්සේරු වර්ෂය සඳහා (ප්‍රාග්ධන වත්කම් කිසිවක් විකිණීමෙන් හෝ වෙනත් යම් බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය මිල දී ගෙන නැවත විකිණීමෙන් ලැබූ ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ" යන වචන හා ඉලක්කම ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "ඒ ව්‍යවසායෙහි සාමාන්‍ය වාර්ෂික ලාභ සහ ආදායම ඉක්මවන" යන වචන වෙනුවට "ඒ ව්‍යවසායෙහි (i) වන අනුඡේදයෙහි සඳහන් වන පරිදි වාර්ෂික ලාභ සහ ආදායමේ සාමාන්‍යය ඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම ඡේදයේ (i) වන අනුඡේදයේ "1978 නොවැම්බර් මස 15 වන දිනට පසු" යන වචන හා ඉලක්කම් වෙනුවට, "1978 නොවැම්බර් මස 15 වන දිනට පසු, එහෙත් 1993 නොවැම්බර් මස 11 වන දිනට පෙර තත් කාර්යය සඳහා ලිඛිත ව කරන ලද ඉල්ලීමක් මත, 1995 මාර්තු මස 31 වන දිනට පෙර" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එම ඡේදයේ (iii) වන අනුඡේදයේ "ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්" යන වචන වෙනුවට "තත් කාර්ය සඳහා 1993 නොවැම්බර් මස 11 වන දිනට පෙර ලිඛිතව කරන ලද ඉල්ලීමක් මත 1995 මාර්තු මස 31 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 ආ වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 20ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ "ආවරණය වන්නේ නම් ආදායම් බද්දෙන් නිදහස් වන්නේය ;" යන වචන වෙනුවට "ආවරණය වන්නේ නම් එය 1995 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් වන්නේය." යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ අතුරු විධානයේ "අදාළ විය යුතු බව" යන වචනවල සිට අතුරු විධානයේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"අදාළ විය යුතු බව, ඒ සැපයුම ශ්‍රී ලංකාවේ බැංකුවක විවෘත කරන ලද ණයවර ලිපියකින් ආවරණය වී තිබේ නම් හෝ ඒ සැපයුමට අදාළ අපනයනය ඇත්ත වශයෙන්ම කරන ලද බවට ඔහුට සෑහීමට පත්වීමට අවශ්‍ය වෙනත් ලේඛන සාක්ෂි ඉදිරිපත් කර තිබේ නම්, ඔහු විසින් විධාන කළ යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 ඇ වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන හා ඉලක්කම් වෙනුවට "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන එහෙත් 1995 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) වන අනුඡේදයේ " මුළු මුදල අදහස් වේ. " යන වචන වෙනුවට " මුළු මුදල අදහස් වේ; තවද " යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

" (ඇ) ' බදු ' යන්නට, 1904 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වන විට, යම් වෙළෙඳ ද්‍රව්‍යයක් අපනයනය සඳහා නිෂ්පාදනය කිරීමේ දී හෝ එම වෙළෙඳ ද්‍රව්‍යය අපනයනය සඳහා ඇසිරීමේ දී භාවිත නො කරන යම් බදු ඇතුළත් නොවිය යුතු ය. ".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ (ඉඉඉ) ඡේදයේ—

(අ) එම ඡේදයේ (ii) වන අනුඡේදයේ " 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙර යම් තැනැත්තකු විසින් " යන වචන හා ඉලක්කම් වෙනුවට, " 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) එම ඡේදයේ (iiඅ) අනුඡේදය ඉවත් කිරීමෙන් ;

(ඇ) එම ඡේදයේ අතුරුවිධානයේ " මේ ඡේදයේ (i) වන අනුඡේදයෙහි හෝ (ii) වන අනුඡේදයෙහි හෝ (iiඅ) අනුඡේදයෙහි හෝ (iii) වන අනුඡේදයෙහි හෝ " ; යන වචන හා ඉලක්කම් වෙනුවට " මේ ඡේදයේ (i) වන අනුඡේදයෙහි හෝ (ii) වන අනුඡේදයෙහි හෝ (iii) වන අනුඡේදයෙහි හෝ " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එම උපවගන්තියේ (ඉඉඉඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඉඉඉඉඉ) ලාභ හා ආදායම් ගණන් බලනු ලබන කාල සීමාව ඇතුළත ඔහු විසින් අත්කර ගන්නා ලදුව යම් කර්මාන්තයක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ඔහු විසින් භාවිත කරනු ලබන යම් පරිගණක මෘදුකාංග වෙනුවෙන් වූ දීමනාවක් : ඒ දීමනාව ඒ පරිගණක මෘදුකාංග අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය :

එසේ වුවද පෙරාතුවම වූ තක්සේරු වර්ෂවල දී ඒ පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද දීමනාවල එකතුව ඒ පරිගණක මෘදුකාංග අත්කර ගැනීමේ පිරිවැයට සමාන නම්, යම් තැනැත්තකුට පරිගණක මෘදුකාංග වෙනුවෙන් මේ ඡේදයේ පූර්ව යෙන් වූ විධිවිධාන යටතේ කිසිම අඩුකිරීමකට ඉඩ නොදිය යුතුය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම ඡේදයේ (i) වන අනුඡේදයේ "සියයට හතළිහකට අඩු නොවන බවට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සහතික කර ඇත්තා වූ හෝ", යන වචන වෙනුවට "සියයට හතළිහකට අඩු නොවන්නා වූ හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම ඡේදයේ (ii) වන අනුඡේදයේ "සියයට හැටකට අඩු නොවන බවට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සහතික කර ඇත්තා වූ ද" යන වචන වෙනුවට "සියයට හැටකට අඩු නොවන්නා වූ ද" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපවගන්තියේ (ට) ඡේදයේ "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු එහෙත් 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම උපවගන්තියේ (ටට) ඡේදය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (3)අ උපවගන්තිය යට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3ආ) (අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් යම් ව්‍යවසායයක් සමග ගිවිසුමකට එළඹ ඇත්තා වූ ද, ඒ ගිවිසුමේ නියමයන් යටතේ ඒ ව්‍යවසායයේ ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස්ව ඇත්තා වූ ද, එම නිදහස් කිරීම වෙනුවට ආදායම් බදු අය කිරීමට යටත් වීමට ස්වකීය මනාපය පළ කර ඇත්තා වූ ද ව්‍යාවසායකට, ලාභයක් වූයේ නම් ඒ ගිවිසුම යටතේ ආදායම් බද්දෙන් නිදහස් වන යම් පාඩුවක්, 1991

අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන අවුරුදු තුනක කාල සීමාව තුළ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් සිදු වී ඇති අවස්ථාවක, එම ව්‍යවසායේ 1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා වූ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන්—

(i) එකී අවුරුදු තුනක කාල සීමාව තුළ එම ව්‍යවසායට සිදු වූ එවැනි යම් පාඩුවල එකතුව ;

(ii) එකී අවුරුදු තුනක කාල සීමාව තුළ බද්දෙන් නිදහස් වූ එම ව්‍යවසායේ මුළු ලාභ සහ ආදායම්

ඉක්මවන මුදල අඩු කළ යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් එම පාඩුවේ ශේෂය සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක්, 1994 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යවසායේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කළ නොහැකි අවස්ථාවක, එකී සම්පූර්ණ මුදල හෝ කොටස ඊළඟට එළඹෙන තක්සේරු වර්ෂය සඳහා ව්‍යවසායේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන්, ආදී වශයෙන් අඩු කරගෙන යා යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (1) වන උප වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ (අ) ඡේදයේ (vii) වන අනුඡේදයේ "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම උපවගන්තියේ (අ) ඡේදයේ (vii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

"(viii) 1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්, මේ පනතේ පළමුවන උපලේඛනයේ 11වී කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණය අනුව.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 ඉ වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 ඉ වගන්තිය සංශෝධනය කිරීම.

"(1) එම ඡේදයේ (i) වන අනුඡේදයේ "රුපියල් එක්දහස් පන් සියයකට සහ" යන වචන වෙනුවට "රුපියල් එක් දහස් පන්සියයකට" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම ඡේදයේ (ii) වන අනුඡේදයේ "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් නම් රුපියල් එක්දහස් අටසියයකට, හෝ", යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1

වන දින හෝ ඉන් පසුව, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර, ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් නම් රුපියල් එක් දහස් අටසියයකට, සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) එම ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

(iii) ඒ තක්සේරු වර්ෂය, 1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් නම්, රුපියල් හයදහසකට හෝ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් VIIIඅ පරිච්ඡේදය ඇතුළත් කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ VIII වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ VIIIඅ පරිච්ඡේදය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

'VIIIඅ පරිච්ඡේදය

සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ඒ ලාභවලින් ලත් ලාභාංශ සම්බන්ධයෙන් බදු පැනවීමට අදාළ විශේෂ විධිවිධාන

ආදායම් බද්දෙන් නිදහස් කිරීම අත් හැරීමට මනාපය දක්වන සමාගම්වල අපනයන ලාභ සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය.

32ඊ. (1) 20 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ යම් සමාගමක් වෙත අවුරුදු පහක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබ ඇත්තා වූ ද ඒ අවුරුදු පහක කාලසීමාවේ ඉකුත් නොවූ කොටස, 1994 අප්‍රේල් මස 1 වන දින වන විට අවුරුදු හතරකට අඩු නොවන්නා වූ ද අවස්ථාවක, ඒ සමාගම විසින්, 1994 දෙසැම්බර් මස 31 වන දිනට පෙර කොමසාරිස් ජනරාල් වෙත යොමු කරන ලද ලිඛිත දැන්වීමක් මගින්, ඒ ඡේදය යටතේ ඒ සමාගම හිමිකම ලැබූ ඒ නිදහස් කිරීම අත්හැර දැමීමට සහ ඒ කාලසීමාවේ ඉකුත් නොවූ කොටස සඳහා ආදායම් බදු අයකරනු ලැබීමට මනාපය පළ කරනු ලැබිය හැකි ය.

(2) යම් සමාගමක් විසින් (1) වන උපවගන්තියේ සඳහන් මනාපය ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවක, 20 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ ඒ සමාගම නිදහස් කිරීම ලැබූ කාලසීමාවේ ශේෂය සම්බන්ධයෙන් ඒ ඡේදය යටතේ වූ යම් ආදායම් බදු නිදහස් කිරීමකට ඒ සමාගම හිමිකම් ලැබීම නතර විය යුතු අතර 1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂ

යක් සඳහා වූ ඒ සමාගමේ බදු අයකළ හැකි ආදායමට 20 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ අනුමත කරන ලද යම් ව්‍යවසායකින් ලැබෙන යම් අපනයන ලාභ සහ ආදායම ඇතුළත් වන විට, ඒ අපනයන ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ බදු අයකළ හැකි ඒ ආදායමේ ඒ කොටස, මේ පනතේ කුමක් සඳහන්ව ඇතද, සියයට දහයක ආදායම් බද්දකට යටත් කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා "අපනයන ලාභ සහ ආදායම" යන්නට, 20 වන වගන්තියේ (2) වන උපවගන්තියේ දෙනු ලැබ ඇති අර්ථයම ඇත්තේ ය.

**1993 නොවැම්බර් මස 10 වන දිනෙන් පසුව යම් නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක් නොවන තැනැත්තන්ගේ අපනයන ලාභ සහ ආදායම සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය.**

32උ. 1993 නොවැම්බර් මස 10 වන දිනෙන් පසුව, (සමාගමක් නොවන) යම් තැනැත්තකු යම් නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන්නා වූ ද, 1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ බදු අය කළ හැකි ආදායමට යම් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් ඇතුළත් වන්නා වූ ද අවස්ථාවක, ඒ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම මගින් සංයුක්ත වන්නා වූ බදු අයකළ හැකි ආදායම් කොටස මේ පනතේ විධිවිධානවලට යටත්ව, ඒ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායමේ යම් කොටසක් හෝ එය මුළුමණින්ම හෝ සියයට දහයේ අනුප්‍රමාණය මත ආදායම් බද්ද අයකරනු ලැබිය හැකි බදු අය කළ හැකි ආදායමට වැඩි වන ප්‍රමාණයද ඇතුළුව සියයට පහළොවක ආදායම් බදු අනුප්‍රමාණය මත ආදායම් බද්දට යටත් කරනු ලැබිය යුතු ය.

**1993 නොවැම්බර් මස 10 වන දිනෙන් පසුව යම් නිශ්චිත ව්‍යවසායක් ආරම්භ කරන සමාගමක් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය.**

32ඌ. යම් සමාගමක් යම් නිශ්චිත ව්‍යවසායක් කර ගෙන යාම 1993 නොවැම්බර් මස 10 වන දිනෙන් පසුව ආරම්භ කරන්නා වූ ද 1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත්, 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායමට යම් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ ද අවස්ථාවක, ඒ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම මගින් සංයුක්ත වන්නා වූ බදු අයකළ හැකි ආදායමේ කොටස, මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, සියයට පහළොවක අනුප්‍රමාණය මත ආදායම් බද්දට යටත් කරනු ලැබිය යුතු ය.

1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් නිශ්චිත ව්‍යවසායක් කරගෙන යන්නා වූ සමාගමක් නොවන තැනැත්තකුගේ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය.

32ඒ. සමාගමක් නොවන 32ළ වගන්තියෙහි සඳහන් තැනැත්තකු හැර, යම් තැනැත්තකු සම්බන්ධයෙන් වනවිට 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ බදු අයකළ හැකි ආදායමට යම් නිශ්චිත ව්‍යවසායකින් ලැබෙන යම් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ අවස්ථාවක, ඒ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම මගින් සංයුක්ත වන්නා වූ බදු අයකළ හැකි ආදායමේ කොටස මේ පනතේ විධිවිධානවලට යටත්ව ඒ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායමේ යම් කොටසක් හෝ එය මුළුමනින්ම හෝ සියයට දහයේ අනුප්‍රමාණයක ආදායම් බද්ද අයකරනු ලැබිය හැකි බදු අයකළ හැකි ආදායමට වැඩි වන ප්‍රමාණයද ඇතුළුව සියයට පහළොවක ආදායම් බදු අනුප්‍රමාණය මත ආදායම් බද්දට යටත් කරනු ලැබිය යුතු ය.

1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් නිශ්චිත ව්‍යවසායක් කරගෙන යන්නා වූ සමාගමක සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය.

32ඓ. 32ළු වගන්තියේ සඳහන් සමාගමක් නොවන යම් සමාගමක් සම්බන්ධයෙන් වනවිට 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ඒ සමාගමේ බදු අයකළ හැකි ආදායමට යම් නිශ්චිත ව්‍යවසායකින් ලැබෙන යම් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් ඇතුළත් වන අවස්ථාවක, ඒ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම මගින් සංයුක්ත වන ඒ බදු අයකළ හැකි ආදායමේ කොටස මේ පනතේ පටහැණිව කුමක් සඳහන් වුවද සියයට පහළොවක අනුප්‍රමාණයක් මත වූ ආදායම් බද්දට යටත් විය යුතු ය.

අපනයන ලාභ සහ ආදායම් කෙරෙන් ලාභාංශ සම්බන්ධයෙන් ආදායම් බදු අනුප්‍රමාණය.

32ඔ. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා (සමාගමක් නොවන) යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායමට පහත සඳහන් යම් ලාභාංශයක්, එනම්,

(i) (අ) 32ඊ වගන්තියේ සඳහන් යම් සමාගමක අපනයන ලාභ සහ ආදායමෙන්, ඒ ලාභ සහ ආදායමෙන් සියයට දහයක අනුප්‍රමාණ මත බද්දක් අය කරනු ලබන කාලය තුළ දී හෝ ඉන් පසුව එක් වර්ෂයක් ඇතුළත හෝ ගෙවන ලද්දා වූ ලාභාංශයක් ; හෝ

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත් වූ

යම් සමාගමක්, ඒ ගිවිසුම යටතේ ඒ සමාගම වෙත ප්‍රදානය කරන ලද නිදහස් කිරීම වෙනුවට, ආදායම් බද්දට යටත් වීමට මනාපය ප්‍රකාශ කර ඇති විට එසේ ආදායම් බද්දට යටත් යම් ලාභ සහ ආදායම සම්බන්ධයෙන් සියයට දහයක අනුප්‍රමාණයක් මත ආදායම් බද්ද අය කිරීමට යටත් ආදායමෙන් එසේ බදු අය කරන කාලය ඇතුළත හෝ ඉනික්බිතිව එක් අවුරුද්දක් ඇතුළත ගෙවන ලද්දා වූ ලාභාංශයක් ; හෝ

(ii) යම් සමාගමකට ලැබුණු (i) (අ) ඡේදයේ හෝ (i) (ආ) ඡේදයේ සඳහන් ලාභාංශවලින් ඒ සමාගම විසින් ගෙවන ලද ලාභාංශ ; පළමුව සඳහන් කරන ලද ලාභාංශය ලැබුණු යම් තක්සේරු වර්ෂයක් තුළ දී හෝ ඉනික්බිතිව එක් වර්ෂයක් ඇතුළත දෙවනුව සඳහන් ලාභාංශය ගෙවනු ලැබ ඇත්නම් ;

(iii) (i) (අ) ඡේදයේ හෝ (i) (ආ) ඡේදයේ සඳහන් ලාභාංශයක් ගෙවීමට මුල් වූ ලාභ සහ ආදායම සියයට දහයක බද්දට යටත් වූ කාලසීමාව තුළ දී හෝ ඉනික්බිතිව අවුරුදු දෙකක් ඇතුළත හෝ යම් සමාගමක් විසින් අතර මැදි සමාගමක් හෝ අතරමැදි සමාගම් වැඩි ගණනක් මගින් ලබාගෙන, ඒ සමාගම විසින් පළමු කී ලාභාංශය ලබාගත් දින සිට එක් වර්ෂයක් ඇතුළත ගෙවන ලද්දා වූ ලාභාංශයක්

ඇතුළත් වන අවස්ථාවක, ඒ ලාභාංශ වලින් සංයෝජිත වන බදු අයකළ හැකි ආදායමේ කොටස මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, සියයට දහයේ අනුප්‍රමාණයක ආදායම් බද්දට යටත් විය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා (සමාගමක් නොවන) යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායමට පනත සඳහන් යම් ලාභාංශයක්, එනම්

(i) (අ) 32උ සහ 32ඒ වගන්තිවල සඳහන් යම් සමාගමක සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම මත සියයට පහළොවක අනුප්‍රමාණය අනුව බදු අයකළ හැකි වන්නේ යම් කාලසීමාවක් තුළ ද ඒ කාලය තුළදී හෝ ඉනික්බිතිව එක් වර්

ෂයක් ඇතුළත දී හෝ ඒ සමාගමේ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායමින් ගෙවනු ලබන ලාභාංශයක් ;

(ආ) 1993 නොවැම්බර් මස 11 වන දිනට පෙර තත්කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත, 1994 දෙසැම්බර් මස 31 වන දිනට පෙර ඇතිකර ගත් යම් ගිවිසුමක් නොවන 1078 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත් වූ යම් සමාගමක ලාභ සහ ආදායම සියයට පහළොවක අනුප්‍රමාණයක බද්දට යටත්ව තිබූ කාලසීමාව තුළ දී හෝ ඉක්බිතිව එක් වර්ෂයක් ඇතුළත දී ඒ සමාගම සියයට පහළොවක අනුප්‍රමාණය මත ආදායම් බද්ද ගෙවා ඇති සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායමින් වූ ලාභාංශයක් වන ;

(ii) යම් සමාගමකට ලැබුණු (i) (අ) ඡේදයේ හෝ (i) (ආ) ඡේදයේ සඳහන් ලාභාංශ වලින් ඒ සමාගම විසින් ගෙවන ලද ලාභාංශ ; පළමුව සඳහන් කරන ලද ලාභාංශය ලැබුණු යම් තක්සේරු වර්ෂයක් තුළ දී හෝ ඉක්බිතිව එක් වර්ෂයක් ඇතුළත දෙවනුව සඳහන් ලාභාංශය ගෙවනු ලැබ ඇත්නම් ;

(iii) (i) (අ) ඡේදයේ හෝ (i) (ආ) ඡේදයේ සඳහන් ලාභාංශයක් ඒවා ගෙවීමට මුල්වූ ලාභ සහ ආදායම ඒවා සියයට පහළොවක බද්දට යටත් වූ කාලය තුළ දී හෝ ඉනික්බිතිව අවුරුදු දෙකක් ඇතුළත හෝ යම් සමාගමක් විසින් ලබාගෙන, ඒ සමාගම විසින් ලබාගත් දින සිට එක් වර්ෂයක් ඇතුළත ගෙවන ලද්දා වූ ද ලාභාංශයක්

යන කවර වූ ලාභාංශයක් ඇතුළත් වන අවස්ථාවක ලාභාංශය මගින් සංයුක්ත වන බදු අය කළ හැකි ආදායම් කොටස, ඒ ලාභාංශ ආදායම් කොටස හෝ ඒ මුළු ලාභාංශ ආදායම සියයට දහයේ අනුප්‍රමාණය මත බදු අය කළ හැකි ආදායමට වැඩිවන තාක් දුරට මේ පනතේ විධිවිධාන වලට යටත්ව සියයට පහළොවක අනුප්‍රමාණය මත ආදායම් බද්දට යටත් කරනු ලැබිය යුතු ය.

(3) යම් සමාගමක බදු අයකළ හැකි ආදායමට (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ සඳහන් යම් ලාභාංශයක් ඇතුළත් වන අවස්ථාවක 35 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව ඒ ලාභාංශයට සම්බන්ධ ඒ බදු අය කළ හැකි ආදායමේ කොටසට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය සියයට පහළොව විය යුතු ය.

යම් හැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක සැලකුණු අපනයන සම්බන්ධයෙන් වූ ආදායම් මත අනුප්‍රමාණය

32ක. (1) 32ට වගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් යම් නිශ්චිත ව්‍යාපාරය කට—

(අ) තොග පිටින් වන කළු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, පොල්තෙල්, (අඛණ්ඩ පරිමාණ ස්වයංක්‍රීය සැකසුම් තාක්ෂණයක භාවිතයෙන් නිෂ්පාදනය කොට තත්ත්ව සහතික වීමක් ඇතිව අලෙවි කරනු ලබන කපාපු පොල් නොවන) කපාපු පොල්, කොප්පරා, අලුත් පොල්, පොල් කෙඳි හෝ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් වෙළෙඳ ද්‍රව්‍ය යක් හැර ඒ නිශ්චිත ව්‍යවසාය විසින් වැඩිමනත් නිෂ්පාදනය කිරීමක් නොමැතිව අපනයනය කිරීම සඳහා යම් වෙළඳ ද්‍රව්‍යයක් ; හෝ

(ආ) ඒ නිශ්චිත ව්‍යවසාය විසින් අපනයනය කිරීම සඳහා යම් වෙළෙඳ ද්‍රව්‍යයක් නිෂ් පාදනය කිරීම සඳහා භාණ්ඩ කිසිවක්

නිෂ්පාදනය කිරීමේ හෝ සැදීමේ සහ සැකසීමේ යම් ව්‍යාපාරයක්, යම් හැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කර ගෙන යනු ලබන අවස්ථාවක, ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම නොවන, (3) වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම වන්නා වූ ඒ සැපයීමෙන් ලැබුණු ලාභ සහ ආදායම, මේ වගන්තියේ මතු සඳහන් විධිවිධානවලට අනුකූලව ආදායම් බද්දට යටත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් හැනැත්තකු, යම් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු වන සමාගමක් ද ඇතුළුව, සමාගමක් වන්නා වූ ද 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ඒ සමාගමේ බදු අයකළ හැකි ආදායමට, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ ද අවස්ථාවක ඒ සමාගමේ ලාභ සහ ආදායම වෙනුවෙන් සියයට පහළොවක අනුප්‍රමාණය මත ආදායම් බද්ද අයකරගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් හැනැත්තකු (යම් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු වන පුද්ගලයකු ද ඇතුළුව) පුද්ගලයකු වන්නා වූ ද 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආර ම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ පුද් ගලයාගේ බදු අයකළ හැකි ආදායමට, (1) වන

උපවගන්තියේ සඳහන් ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ ද අවස්ථාවක ඒ පුද්ගලයාගෙන් මේ පනතේ විධිවිධාන වලට යටත්ව, සියයට දහයේ අනුප්‍රමාණය මත ආදායම් බද්දකට යටත් බදු අය කළ හැකි ආදායමට වැඩි ඒ ලාභ සහ ආදායම් කොටස හෝ මුළු ප්‍රමාණය ඇතුළුව සියයට පහළොවක අනුප්‍රමාණය මත වූ ආදායම් බද්ද අය කර ගත යුතු ය.

(4) (1) වන, (2) වන සහ (3) වන උපවගන්ති වල විධිවිධාන, එහි සඳහන් කරන ලද සැපයීම්—

(අ) (1) වන උපවගන්තියේ සඳහන් නිශ්චිත ව්‍යවසාය කරගෙන ගිය තැනැත්තාගේ හෝ යම් හවුල් ව්‍යාපාරයක යම් හවුල් කරුවකුගේ හෝ බදු අයකළ හැකි ආදායම, මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ආදායම් බද්දට යටත් කළ හැකි කාලසීමාව තුළ කරනු ලැබුවේ නම්,

(ආ) ඒ සැපයීම්වලට අදාළ අපනයන ඇත්ත වශයෙන් ම කරන ලද බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරනු ලැබූ සැප යීම් වේ නම්

අදාළ විය යුතු ය.

යම් වාසික සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර සිදුකරන ලද සේවාවන්ගෙන් ලැබෙන ලාභ සහ ආදායම සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය.

32ග. (1) යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකාවේ යම් වාසික සමාගමක් හෝ යම් හවුල් ව්‍යාපාරයක් 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී, ඒ සමාගම විසින් හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර ඒ වෘත්තිය, රක්ෂාව කරගෙන යාමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී නැතහොත් යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධ වූ යම් ඉදිකිරීම් ව්‍යාපෘතියක දී ඒ තක්සේරු වර්ෂය තුළ දී කරන ලද සේවාවන් සම්බන්ධයෙන් විදේශ ව්‍යවහාර මුදල් වලින් යම් ලාභ සහ ආදායමක් උපයන්නා වූ සහ එසේ උප යන ලද ඒ ලාභ සහ ආදායම (සාධාරණ වියදම් වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා සලකන යම් මුදල් ප්‍රමාණයක් අඩු කර) ඒ සමාගම හෝ හවුල් ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක, ඒ ලාභ සහ ආදායම, මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, මේ වගන්තියේ මතු සඳහන් විධිවිධානවලට අනුකූලව ආදායම් බද්දට යටත් කරනු ලැබිය යුතු ය.

(2) 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (1) වන උපවගන්තියේ සඳහන් සමාගමක බදු අය කළ හැකි ආදායමට, (1) වන උපවගන්තියේ සඳහන්

ලාභ සහ ආදායම ඇතුළත් වන අවස්ථාවක, ඒ ලාභ සහ ආදායම මත සියයට පහළොවක අනුප්‍රමාණයක ආදායම් බද්ද ඒ සමාගමෙන් අයකරනු ලැබිය යුතු ය.

(3) සමාගමක් නොවන යම් හවුල් ව්‍යාපාරයක යම් හවුල්කරුවකුගේ (1) වන උපවගන්තියේ සඳහන් යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ බදු අය කළ හැකි ආදායමට ඒ හවුල් ව්‍යාපාරයේ තම ලාභ කොටසින් තමාට උපචිත වූ (1) වන උපවගන්තියේ සඳහන් ලාභ සහ ආදායමක් ඇතුළත් වන අවස්ථාවක, මේ පනතේ විධිවිධානවලට යටත්ව ඒ ලාභ සහ ආදායම සියයට දහයේ අනුප්‍රමාණය මත වූ ආදායම් බද්දට යටත් බදු අයකළ හැකි ආදායමට වැඩිවන ප්‍රමාණය ඇතුළුව ඒ ලාභ සහ ආදායමේ කොටස හෝ ඒ මුළු ලාභ හෝ ආදායම් සම්බන්ධයෙන් සියයට පහළොවක අනුප්‍රමාණය මත ආදායම් බද්ද අයකරනු ලැබිය යුතු ය.

යම් පුද්ගලයකු හෝ යම් හවුල් ව්‍යාපාරයක් විසින් විදේශීය ව්‍යවහාර මුදලින් උපයාගත් යම් පඩි නඩි සහ ගාස්තු මත වූ ආදායම් බදු අනුප්‍රමාණය.

32ජ. (1) 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ දී ශ්‍රී ලංකාවේ යම් පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, ශ්‍රී ලංකාවේ දී, එහෙත් ශ්‍රී ලංකාවෙන් බැහැර ව යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් යටතේ සේවයේ යෙදී සිටිය දී නොව, ඒ පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය විසින් කරගෙන ගිය හෝ ක්‍රියාත්මක කරන ලද සාහිත්‍ය හෝ ලලිත කලා ක්ෂේත්‍රයේ යම් රක්ෂාවක් හෝ යම් වෘත්තියක් කරගෙන යාමේ දී ශ්‍රී ලංකාවෙන් බැහැර යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ඒ පුද්ගලයා හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාවේ දී කරන ලද සේවාවන් වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදල් වලින් යම් පඩි නඩි සහ ගාස්තු උපයන්නා වූ සහ ඒ පඩි නඩි සහ ගාස්තු බැංකුවක් මගින් ශ්‍රී ලංකාවේ ඒ පුද්ගලයා හෝ ඒ හවුල් ව්‍යාපාරය වෙත ප්‍රේෂණය කරනු ලබන්නා වූ ද අවස්ථාවක ඒ පඩිනඩි සහ ගාස්තු සම්බන්ධයෙන් මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ වගන්තියේ මතු සඳහන් විධිවිධානවලට අනුකූලව ආදායම් බද්ද අයකරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායමට, ඔහු විසින් උපයන ලද්දා වූ (1) වන උපවගන්තියේ සඳහන් පඩිනඩි හා ගාස්තු කිසිවක් හෝ ශ්‍රී ලංකාවේ යම් හවුල් ව්‍යාපාරයකින් ලැබූ ලාභවල තම කොටස වශයෙන් තමාට උපචිත වූ ඉහතකී පඩිනඩි හා ගාස්තු කිසිවක් හෝ ඇතුළත් වන්නා වූ අවස්ථාවක මේ පනතේ විධිවිධාන වලට යටත්ව ඒ පඩිනඩි හා ගාස්තු වලින් කොට

ගක් හෝ මුළුමනින්ම හෝ සියයට දහයේ අනුප්‍රමාණය මත වූ ආදායම් බද්දට යටත් බදු අයකළ හැකි ආදායමට වැඩිවන ප්‍රමාණයට සියයට පහලොවක අනුප්‍රමාණය මත ආදායම් බද්දට යටත් කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

32ට. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා—

(අ) යම් තැනැත්තකු සම්බන්ධයෙන් "සුදුසුකම් ලැබූත් අපනයන ලාභ සහ ආදායම්" යෙදෙන විට, ඉන් ඒ තැනැත්තා විසින් කරගෙන ගිය යම් නිශ්චිත ව්‍යවසායකින් ඒ තක්සේරු වර්ෂය සඳහා මේ පනතේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරන ලද (මැණික් සහ ස්වර්ණාභරණ විකිණීමෙන් ලත් ලාභ සහ ආදායම සහ යම් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලත් ලාභ සහ ආදායම් බැහැර කිරීමෙන් පසුව 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල) ලාභ සහ ආදායමට පහත සඳහන් සම්බන්ධතාව, එනම්, ඒ තක්සේරු වර්ෂයේ ඒ ව්‍යාපාරයේ මුළු පිරිවැටුමට ඒ තක්සේරු වර්ෂයේ ඒ ව්‍යාපාරයේ අපනයන පිරිවැටුම යම් අනුපාතයක් දරන්නේ ද එකී ලාභ සහ ආදායමට ඒ අනුපාතයම දරන මුදල අදහස් වේ;

(ආ) "අපනයන පිරිවැටුම" යන්න, යම් නිශ්චිත ව්‍යවසායක් සම්බන්ධයෙන් යෙදෙන විට, භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය අපනයනය කිරීමෙන් හෝ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් යම් සේවාවක් සැපයීමෙන් හෝ ඒ ව්‍යවසාය විසින් ලබා ගත්තේ හෝ නොගත්තේ වුව ද, ලබා ගත හැකි වූ මුළු මුදල අදහස් වන නමුත්, එයට—

(i) මැණික් හෝ ස්වර්ණාභරණ අපනයන කිරීමෙන් හෝ ප්‍රාග්ධන වත්කම් කිසිවක් විකිණීමෙන්, ලබා ගත්තේ හෝ නොගත්තේ වුවද, ලබාගත හැකි වූ යම් මුදලක් ; සහ

(ii) තොග වශයෙන් වූ කළු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, පොල් තෙල්, (අඛණ්ඩ පරිමාණ ස්වයංක්‍රීය සැකසුම් තාක්ෂණය

භාවිතයෙන් නිෂ්පාදිත සහ තත්ව සහතිකයක් ඇතිව අලෙවි කරනු ලබන කපාපු පොල් නොවන) කපාපු පොල්, කොප්පරා, අලුත් පොල්, පොල් කෙඳි හෝ අමාත්‍ය වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නිශ්චිතව සඳහන් කරන ලද වෙනත් යම් වෙළෙඳ ද්‍රව්‍යයක් අප නයනය කිරීමෙන් ලබා ගත්තේ හෝ නොගත්තේ වුවද, ලබාගත හැකි වූ යම් මුදලක්;

(iii) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම් නොවන ලාභ සහ ආදායම් කිසි වක්

ඇතුළත් නොවේ;

(ඇ) "මුළු පිරිවැටුම" යන්න, මේ නිශ්චිත ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් යම් ව්‍යාපාරයක් විසින් කර ගෙන යනු ලබන යම් ව්‍යාපාරයකින් හෝ වෙළෙඳාමකින්, ලබාගත්තේ හෝ නොගත්තේ වුවද, ලැබිය හැකි වූ මුළු මුදල අදහස් වන නමුත්, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම නොවන ආදායම් කිසිවක්, ප්‍රාග්ධන වත්කම්, මැණික් හෝ ස්වර්ණාභරණ විකිණීමෙන්, ලබාගත්තේ හෝ නොගත්තේ වුවද ලබාගත හැකි වූ, යම් මුදල් ප්‍රමාණයක් ඊට ඇතුළත් නොවේ;

(ඈ) "නිශ්චිත ව්‍යවසාය" යන්නෙන්—

(i) ඒ ව්‍යවසාය විසින් සාදන ලද, නිෂ්පාදනය කරන ලද හෝ මිලට ගන්නා ලද සම්ප්‍රදායික නොවන භාණ්ඩ අපනයනය කිරීමෙන්; හෝ

(ii) විදේශ ව්‍යවහාර මුදලින් වූ ගෙවීම් සඳහා නැව් අළුත්වැඩියා කිරීම නැව් බිඳ හෙලීම, මුහුදු නැව් බඩු කන්ටේනර් අළුත් වැඩියා කිරීම හා යථා තත්ත්වයට පත් කිරීම, පරිගණක මෘදුකාංග, පරිගණක වැඩසටහන්, පරිගණක පද්ධති

සැපයීම හෝ පරිගණක දත්ත සටහන් ගත කිරීම පිළිබඳ යම් සේවාවක් හෝ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් සේවාවක් ඉටුකිරීමෙහි

නිරත වන යම් ව්‍යාපාරයක් අදහස් වේ.

මේ වගන්තියේ කාර්ය සඳහා "සම්ප්‍රදායික නොවන භාණ්ඩ" යන්නෙන්, තොග වශයෙන් වූ කළු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, පොල් තෙල් (අඛණ්ඩ පරිමාණ ස්වයංක්‍රිය සැකසුම් තාක්ෂණය භාවිතයෙන් නිෂ්පාදිත, තත්ත්ව සහතිකයක් ඇතිව අලෙවි කරනු ලබන කපාපු පොල් නොවන) කපාපු පොල්, කොප්පරා, අලුත් පොල්, පොල් කෙඳි හෝ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නිශ්චිතව සඳහන් කරනු ල බිය හැකි වෙළඳ ද්‍රව්‍යයක් නොවන භාණ්ඩ අදහස් වේ.'.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපවගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයේ (i) වන ඡේදයේ "1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන්පසු ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන්පසු ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් යෙදීමෙන්;

(2) එම උපවගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන්:—

"එසේම තවදුරටත්, යම් සමාගමක් විසින් සම්බන්ධ තක්සේරු වර්ෂයක් තුළ දී 8 වන වගන්තියේ (අ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති සමාගමකට හෝ පුද්ගල මණ්ඩලයකට බෙදාහරිනු ලැබූ යම් දළ ලාභාංශ මත (ආ) ඡේදය යටතේ වූ බද්ද ගෙවීමට පළමුව සඳහන් කළ සමාගම යටත් නොවිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වගන්තිය සංශෝධනය කිරීම.**

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

" (2) 1988 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සෑම වාසික සමාගමක් විසින් ම—

(අ) 33(1) (අ) වගන්තිය යටතේ ; හෝ

(ආ) 32ඊ වගන්තිය යටතේ හෝ 32උ වගන්තිය යටතේ හෝ 32 ඔ වගන්තිය යටතේ

ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දේ 97 වන වගන්තියේ සඳහන් යම් ත්‍රෛමාසික වාරිකයකින්, ඒ තක්සේරු වර්ෂය තුළ දී නමුත් 97 වන වගන්තිය යටතේ ඒ වාරිකය ගෙවිය යුතු නියමිත දිනයට පෙර, එය විසින් ගෙවන ලද අත්තිකාරම් සමාගම් බද්ද අඩු කර ගැනීමට සෑම සමාගමකටම හිමිකම ලැබිය යුතු ය. ඒ අඩුකිරීම, ඒ සමාගම විසින් ඒ තක්සේරු වර්ෂය තුළ දී—

(i) 33(1) වගන්තිය යටතේ ; සහ

(ii) 32 ඊ වගන්තිය යටතේ හෝ 32 උ වගන්තිය යටතේ හෝ 32 ඔ වගන්තිය යටතේ

ගෙවිය යුතු මුළු බද්දෙන් සියයට පනහකට වැඩි නොවිය යුතුය. "; තවද

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "තක්සේරු වර්ෂය සඳහා ආදි වශයෙන්" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන සහ ඉලක්කම් වෙනුවට "තක්සේරු වර්ෂය සඳහා ආදි වශයෙන්, 32(1) (අ) වගන්තිය හෝ 32ඊ වගන්තිය හෝ 32උ වගන්තිය හෝ 32 ඔ වගන්තිය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු වන බද්දෙන් 125 (2) වන වගන්තියේ අතුරු විධානයේ (iv) වන ඡේදයේ විධිවිධානවලට අනුකූලව අඩු කළ යුතු ය. එහෙත් යම් තක්සේරු වර්ෂයක් සඳහා 33(1) (අ) වගන්තිය හෝ 32ඊ වගන්තිය හෝ 32උ වගන්තිය හෝ 32ඔ වගන්තිය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු බද්දෙන් අත්තිකාරම් සමාගම් බද්ද වෙනුවෙන් අඩු කරනු ලැබිය යුතු මුළු මුදල ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගම විසින් 33(1) (අ) වගන්තිය හෝ 32ඊ වගන්තිය හෝ 32උ වගන්තිය හෝ 32 ඔ වගන්තිය යටතේ ගෙවිය යුතු බද්දෙන් සියයට පණහක් නො ඉක්මවිය යුතුය. " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (i) වන ඡේදයේ (ඇ) අනුඡේදයේ—

(අ) (iii) වන විෂයට ඉක්බිතිවම පහත දැක්වෙන විෂය ඇතුළත් කිරීමෙන් :—

"(iiiඅ) සියයට විසිහත බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවන්නට යෙදුනේ යම් ලාභාංශවලට අදාළව ද ඒ ලාභාංශ"; සහ

(ආ) එම අනුඡේදයේ (iv) වන විෂයට ඉක්බිතිවම පහත දැක්වෙන විෂයයන් ඇතුළත් කිරීමෙන් :—

"(ivඅ) සියයට අට බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවන්නට යෙදුනේ යම් ලාභාංශ වලට අදාළව ද ඒ ලාභාංශ;

(ivආ) සියයට පහ බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවන්නට යෙදුනේ යම් ලාභාංශ වලට අදාළව ද ඒ ලාභාංශ;" සහ

(2) එම වගන්තියේ (2) වන ඡේදයේ (ආ) අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:—

"(ආ) (i) 32 ඊ වගන්තිය යටතේ;

(ii) 32 ඌ වගන්තිය යටතේ;

(iii) 32 ඔ වගන්තිය යටතේ;

(iv) මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයන් හැර වෙනත් අනුප්‍රමාණයන් අනුව

බදු අයකළ හැකි ලාභ සහ ආදායම්; සහ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "කෙරෙන අණක ආකාරයෙන් යම් කොටස්කරුවකුට" යන වචන වෙනුවට "කෙරෙන අණක ආකාරයෙන්, 8 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ ලාභ සහ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති කොටස්කරුවකු නොවන යම් කොටස් කරුවකුට" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ—

(i) එම උපවගන්තියේ (ඈ) ඡේදයේ—

(අ) (iii) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iiiඅ) සියයට විසි හත බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවන්නට යෙදුනේ යම් ලාභාංශවලට අදාළව ද ලැබුණු ඒ ලාභාංශ වලින් ;" ; සහ

(ආ) (iv) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ivඅ) සියයට අට බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවන්නට යෙදුනේ යම් ලාභාංශවලට අදාළව ද ලැබුණු ඒ ලාභාංශවලින් ;

(ivආ) සියයට පහ බැගින් අත්තිකාරම් සමාගම් බද්ද ගෙවන්නට යෙදුනේ යම් ලාභාංශවලට අදාළව ද ලැබුණු ඒ ලාභාංශවලින් ;"; සහ

(ii) එම උපවගන්තියේ (ඊ) ඡේදයේ "(ඈ) ඡේදයේ (ii) වන හෝ (iii) වන හෝ (iv) වන අනුඡේදයේ සඳහන් ලාභාංශයකින් ගෙවනු" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(ඈ) ඡේදයේ (ii) වන හෝ (iiඅ) හෝ (iii) හෝ (iv) හෝ (ivඅ) හෝ (ivආ) අනුඡේදවල සඳහන් ලාභාංශවලින් ගෙවනු" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (2අ) උපවගන්තියේ—

(අ) (ii) වන ඡේදයේ "ලද යම් ගෙවීම්" යන වචන වෙනුවට "ලද යම් ගෙවීම්; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ii) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්—

"(iii) 1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, 32ඊ වගන්තිය යටතේ හෝ 32ඌ වගන්තිය යටතේ හෝ 32ඔ වගන්තිය යටතේ වූ බද්ද සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය තුළ කරන ලද යම් ගෙවීම්".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 35අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 35අ වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස අංක යෙදීමෙන් ;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) මේ වගන්තියේ විධිවිධාන—

(අ) 32ඊ වගන්තිය හෝ 32උ වගන්තිය හෝ 32ඌ වගන්තියේ විධිවිධාන අදාළ වන තැනැත්තකුට ;

(ආ) 32ඒ වගන්තියේ හෝ 32ඔ වගන්තියේ විධිවිධාන අදාළ වන තැනැත්තකුට

අදාළ නොවිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඇ වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ වගන්තිය යටතේ" යන වචනවල "අදහස් වේ" යන වචන දක්වා වූ සියලු වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"මේ වගන්තිය යටතේ අඩු කිරීමක කාර්ය සඳහා, "පොලිය" යන්නෙන් යම් තක්සේරු වර්ෂයක දී ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ නොමැත්තා වූ හෝ ඒ සම්බන්ධයෙන් 81 වන වගන්තිය යටතේ අඩු කිරීමක් කරනු නොලැබුවා වූ හෝ—

(අ) ආදායම් බදු අය කරනු ලැබිය යුතු තැනැත්තකු බැංකුවකින් හෝ මුදල් ආයතනයකින් ලබාගත් පොලිය ; හෝ

(ආ) (i) යම් තැනැත්තකු විසින් දරන්නා වූ ආණ්ඩුවේ සුරැකුම්පතක් මත,

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව හැරුනු විට වෙනත් යම් තැනැත්තකු විසින් දරනු ලබන භාණ්ඩාගාර බිල්පතක් මත

පොලිය හෝ වට්ටම්, වශයෙන් ලබාගත් මුදල් ප්‍රමාණයක් නොවන්නා වූ බැංකුවකින් හෝ මුදල් ආයතනයකින් නිකුත් කරනු ලබන බැඳුම්කරයක් වෙනුවෙන් පොලිය හෝ වට්ටම් වශයෙන් ඒ තැනැත්තා විසින් ලබා ගත් යම් මුදල් ප්‍රමාණයක්

අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඈ වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඈ වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.—

"ආදායම් බද්ද ගණනය කිරීම.

113ඈ. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා යම් නිශ්චිත සේවායෝජකයකුගේ යම් සේවානියුක්තයකුට අදාළව නිල පඩිනඩිවලට ආරෝපණය කළ හැකි ආදායම් බද්ද පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(අ) 1993 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා—

(i) සේවා නියුක්තයාගේ පඩිනඩිවලින් රුපියල් හතලිස් දෙදහසක මුදලක් අඩු කිරීමෙන් පසු ඒ පඩිනඩි මත මේ පනතේ පළමුවන උපලේඛනයේ 11ඇ කොටසේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයන් අනුව, ගණන් බලන ලද ආදායම් බද්ද ;

(ii) රුපියල් එක් දහස් අට සියය ඉක්මවන්නා වූ මුදල් ප්‍රමාණය විය යුතු ය.

(ආ) 1994 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට,—

(i) ඒ සේවානියුක්තයාගේ එකී පඩි නඩි වලින් රුපියල් හතලිස් දෙදහසක් අඩු කිරීමෙන් පසු, මේ පනතේ පළමුවන උපලේඛනයේ 11ඊ වන කොටසේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණ අනුව ඒ මත ගණන් බලන ලද ආදායම් බද්ද;

(ii) රුපියල් හයදහස

ඉක්මවන්නා වූ මුදල් ප්‍රමාණය විය යුතුය. ".

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තියේ (ඇ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධනය කිරීම.**

" (ඉ) 97 වන වගන්තියේ සඳහන් වන්නා වූ ද යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු වන්නා වූ ද ආදායම් බද්දක ත්‍රෛමාසික වාරිකය සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් ; ".

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 149 වන වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 149 වන වගන්තිය සංශෝධනය කිරීම.**

" (7) 35 වන වගන්තියේ පටහැණිව කුමක් සඳහන් ව තිබුණ ද, 1991 අප්‍රේල් මස 1 වන දින දී හෝ ඉන් පසු බෙදා හරිනු ලැබුවා වූ ද, 8 වන වගන්තියේ (අ) ඡේදය යටතේ ස්වකීය ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් වන යම් තැනැත්තකුට වාසික සමාගමක් විසින් ගෙවනු ලැබුවා වූ ද, ලාභාංශයක් සම්බන්ධයෙන් 38 වන වගන්තියට අනුකූලව අඩු කරගෙන ඇති යම් බද්දක්, ඒ බද්ද අඩුකර ගනු ලැබූ තක්සේරු වර්ෂය අවසාන වීමෙන් පසු එළඹෙන වර්ෂ තුන ඇතුළත දී ඒ තැනැත්තා විසින් යථා පරිදි, ලිඛිතව කරනු ලබන හිමිකම් පෑමක් මත, ඒ තැනැත්තාට ආපසු ගෙවනු ලැබිය යුතු ය. ".

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ " සුදුසුකම් ලබන බෙදා හැරීම " යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත දක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.**

'' "සුදුසුකම් ලබන බෙදා හැරීම" යන්නට—

(අ) 1988 අප්‍රේල් මස 1 වන දින දී හෝ ඊට පසු, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, වාසික සමාගමක් විසින්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමින් බදු අය කළ හැකි නම් ඒ සමාගම අයත් වන වර්ගයේ සමාගම්වලට අදාළ වන අනුප්‍රමාණ වශයෙන් මේ පනතේ දෙවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් උචිත අනුප්‍රමාණය මත, බදු අය කළ හැකි ඒ සමාගමේ යම් ආදායමකින්, කොටස් හිමියකු වෙත මුදලින් හෝ මුදල් ගෙවීම සඳහා වූ යම් ඇණවුමක් මගින් බෙදා දෙන ලද මුළු දළ ලාභාංශය හෝ ඉන් යම් කොටසක් අදහස් වන අතර, එනමුදු—

(i) 1988 අප්‍රේල් 1 වන දිනයට පෙර ඒ සමාගමට උපචිත වූ හෝ ලැබුණු ලාභවලින් නැතහොත් ආදායමෙන් ;

(ii) ඒ සමාගමේ බද්දෙන් නිදහස් කළ ආදායමෙන් ; සහ

(iii) ඒ සමාගමට ලැබුණු ලාභාංශවලින් ලත් යම් ආදායමකින්

බෙදා හරිනු ලැබූ යම් ලාභාංශයක් ඊට ඇතුළත් නොවේ.

(ආ) 1994 අප්‍රේල් 1 වන දිනෙන් හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, වාසික සමාගමක් විසින් ඒ සමාගමේ පහත දැක්වෙන ලාභ අතුරින්, එනම්,—

(i) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ලාභ මත බදු අය කළ හැකි නම් මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණ අනුව ඒ සමාගම අයත් පන්තියේ සමාගම්වලට අදාළ වන උචිත අනුප්‍රමාණය අනුව බදු අය කරනු ලැබිය හැකි ලාභ ; හෝ

(ii) 32ඊ වගන්තියේ හෝ 32උ වගන්තියේ හෝ 32ඖ වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අය කරනු ලැබිය හැකි ලාභ

අතුරින්, මුදලින් හෝ මුදල් ගෙවීම සඳහා වූ ඇණවුම් මගින් කොටස් හිමියකු වෙත බෙදා දෙන ලද යම් දළ ලාභාංශයක් හෝ ඉන් යම් කොටසක් අදහස් වන නමුත් පහත දැක්වෙන යම් ලාභාංශයක්,

(අ) එනම්,—

(i) 1988 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඒ සමාගමට උපචිත වූ හෝ ලැබුණු ලාභ හෝ ආදායම් වලින් ;

(ii) ඒ සමාගමේ නිදහස් කළ ආදායමෙන් ;

(iii) ඒ සමාගමට ලැබුණු ලාභාංශ වලින් ඉපැයූ යම් ආදායමකින් බෙදා හරින ලද ලාභාංශයක් ; හෝ

(ආ) 8 වන වගන්තියේ (අ) ඡේදය යටතේ යම් තැනැත්තකු ගේ ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කර තිබේද එවැනි තැනැත්තකුට ගෙවන ලද ලාභාංශයක්

ඊට ඇතුළත් නොවේ.',

29. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එම උපලේඛනයේ IIඅ කොටසේ "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර, ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය :—" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම උපලේඛනයේ IIඅ කොටසට ඉක්බිතිව ම පහත දැක් වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"IIඊ කොටස

1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

| | |
|---|---|
| බදු අය කළ හැකි ආදායමේ පළමු රු. 35,000 මත | සියයට 10 |
| බදු කළ හැකි ආදායමේ ඊළඟ රු. 25,000 මත | සියයට 20 |
| බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 25,000 මත | සියයට 30 |
| බදු අය කළ හැකි ආදායමේ ශේෂය මත | සියයට 35" |

30. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එම උපලේඛනයේ IVඇ කොටසේ "1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ" යන වචන හා ඉලක්කම් වෙනුවට "1993 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අනුප්‍රමාණය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම උපලේඛනයේ XI වන කොටස වෙනුවට පහත දැක් වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"XI වන කොටස

ඒකක භාරයක්, අන්‍යොන්‍ය අරමුදලක් සහ (ශ්‍රී ලංකා මහ බැංකුව හැර) රාජ්‍ය සංස්ථාවක් ඇතුළත් වූ ද, එහෙත් IVඇ කොටසෙහි සඳහන් කුඩා සමාගමක් ඇතුළත් නොවන්නා වූද සමාගමක්—

1993 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය—

සමාගමේ බදු අය කළ හැකි ආදායම මත සියයට 40 ";

(3) එම උපලේඛනයේ XI වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"XII වන කොටස

ඒකක භාරයක්, අන්‍යොන්‍ය අරමුදලක් සහ (ශ්‍රී ලංකා මහ බැංකුව හැර) රාජ්‍ය සංස්ථාවක් ඇතුළත් වූ සමාගමක්—

1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම ආදායම් බදු අනුප්‍රමාණය—

සමාගමේ බදු අය කළ හැකි ආදායම මත සියයට 35 ".

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපලේඛනයේ 1 වන ඡේදයේ "1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම්වල සිට එම ඡේදයේ අවසානය දක්වා ඇති වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"1993 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා—

බදු අයකළ හැකි ආදායමේ පළමු රු. 25,000 මත සියයට 30

බදු අයකළ හැකි ආදායමේ ශේෂය මත සියයට 40

1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

බදු අයකළ හැකි ආදායම මත සියයට 35";

(2) එම උපලේඛනයේ 9 වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"9. (ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන) ආණ්ඩු :—

1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන වෙනත් ආණ්ඩුවල බදු අය කළ හැකි ආදායම මත සියයට 55

1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන වෙනත් ආණ්ඩුවල බදු අය කළ හැකි ආදායම මත සියයට 35 ";

(3) ඒ උපලේඛනයේ 11 වන ජේදයේ—

(i) එම ජේදයේ (ඇ) අනුජේදයේ " 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා " යන වචන හා ඉලක්කම් වෙනුවට " 1993 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ii) එම ජේදයේ (ඇ) අනුජේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුජේදය එකතු කිරීමෙන් :—

" (ඉ) 1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා

(i) බදු අයකළ හැකි ආදායම මත සියයට 35

(ii) ලාභවලින් (1) වන ජේදය යටතේ ගෙවිය යුතු බදු අය කළ පසු ලාභවල ශේෂය මත සියයට 25.".

32. ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය ප්‍රතිස්ථාපනය කිරීම.

"හත්වන උපලේඛනය [33අ(1) වන වගන්තිය]

1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත

සියයට 25

(ii) නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලට සමාන මුදල මත

සියයට 33 1/3

(iii) ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් විසින් හෝ කුඩා සමාගමක් හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත

සියයට 50

පිළිවෙලින් 1992 අප්‍රේල් මස 1 වන දින සහ 1993 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂ දෙක සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණය පහත දැක්වෙන පරිදි විය යුතුය :—

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත

සියයට 25

(ii) නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලට සමාන මුදල මත

සියයට 33 1/3

(iii) ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් විසින් හෝ කුඩා සමාගමක් හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත

සියයට 40

1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය :—

(i) ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් හෝ වෙනත් යම් සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත — සියයට 27

(ii) 32 ඌ වගන්තියේ හෝ 32 ඔ වගන්තියේ විධිවිධාන වලට අනුකූලව බදු අයකරනු ලබන ලාභවලින් සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලට සමාන මුදල මත සියයට 8

(iii) 32ඊ වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අය කරනු ලබන ලාභවලින් සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත සියයට 5."

**33.** (1) මේ පනතේ 2(3) වන වගන්තියෙන් තේ, රබර් සහ පොල් සඳහා වූ අරමුදල ආදායම් බද්දෙන් නිදහස් කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට කරන ලද සංශෝධනය 1985 ජූනි මස 26 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. — අතීතගාමී බලපෑම.

(2) මේ පනතේ 5 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට කරන ලද සංශෝධනය 1993 ඔක්තෝබර් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 6(4) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට කරන ලද සංශෝධනය 1994 අප්‍රියෙල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ 7 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තියට කරන ලද සංශෝධනය 1994 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(5) මේ පනතේ 8 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඊ වගන්තියට කරන ලද සංශෝධනය 1994 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(6) මේ පනතේ 12 (1) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට කරන ලද සංශෝධනය 1993 අගෝස්තු මස 18 වන දින සිට බලාත්මක වූ සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(7) මේ පනතේ 14 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට කරන ලද සංශෝධනය 1993 අගෝස්තු මස 18 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(8) මේ පනතේ 24 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තියට කරන ලද සංශෝධනය 1994 ජූලි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

**35.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1.160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.